06 ඒකකය - කාලය(2)

➢ **කාලය ආශ්‍රිත ගණනය කිරීම්**

අවුරුදු	මාස	දින
5	6	23
+6	8	15
		8

දින තීරයේ දින ගණන් එකතු කරමු.
දින 23 + දින 15 = දින 38
දින 38 = මාස 1 + දින 8
දින 8, දින තීරයේ ලියා මාස 1, මාස තීරයට ගෙනගොස් එකතු කරමු.

අවුරුදු	මාස	දින
5	6	23
+6	8	15
12	3	8

මාස 1 + මාස 6 + මාස 8 = මාස 15 = අවුරුදු 1 මාස 3
මාස 3, මාස තීරයේ ලියමු.
අවුරුදු 1 අවුරුදු තීරයට ගෙන ගොස් එකතු කරමු.

අවුරුදු 1 + අවුරුදු 5 + අවුරුදු 6 = අවුරුදු 12

අවුරුදු	මාස	දින
28	2	2
−12	3	8
		24

දින තීරයේ දින ගණන් අඩු කරමු.
2 < 8 බැවින්, මාස තීරයෙන් මාස 1ක්, එනම් දින 30ක් දින තීරයට ගෙන යමු.
එවිට දින 30 + දින 2 = දින 32
දින 32 − දින 8 = දින 24
දින 24, දින තීරයේ ලියමු.

අවුරුදු	මාස	දින
28	2	2
−12	3	8
15	10	24

මාස තීරයේ ඉතිරි මාස 1න් මාස 3ක් අඩු කළ නොහැකි ය. ඒ නිසා අවුරුදු තීරයෙන් අවුරුදු 1ක් එනම් මාස 12ක් මාස තීරයට රැගෙන යමු.
එවිට මාස 12 + මාස 1 = මාස 13
මාස 13 − මාස 3 = මාස 10
මාස 10 මාස තීරයේ ලියමු.

අවුරුදු තීරයේ ඉතිරි අවුරුදු 27න් 12ක් අඩු කළ විට, අවුරුදු 15කි.

➢ **ඔබේ ගණිතය පෙළ පොතෙහි 6.3 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.**